**නිපුණතා පාදක විෂය නිර්දේශය**

**මූලික පිරිවෙණ**

**(1 - 5 ශ්‍රේණි)**

# සිංහල

**2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ**

**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**

**අධ්‍යාපන අමාත්‍යාංශය , ඉසුරුපාය ,බත්තරමුල්ල**

**සිංහල**

**01 - 05 ශ්‍රේණි සඳහා**

**නිපුණතා පාදක විෂය නිර්දේශය - මූලික පිරිවෙන්**

**ප්‍රථම මුද්‍රණය - 2016**

**මුද්‍රණය සහ බෙදාහැරීම**

**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,**

**අධ්‍යාපන අමාත්‍යාංශය,**

**ඉසුරුපාය,**

**බත්තරමුල්ල.**

**වෙබ් අඩවිය** :- www.pirivena.sch.lk

**විද්‍යුත් තැපෑල** :- piriven@moe.gov.lk

**මුද්‍රණය : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්**

**නො. 2/60, රවුම් පාර, දිවුලපිටිය පිහිටි සරස්වතී ප්‍රකාශන ආයතනයේ**

**මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.**

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ නාහිමිපාණන් ගේ පණිවුඩය

ලෝකයේ දියුණු නොදියුණු සෑම රටක ම කලින් කලට අධ්‍යාපනයට අදාළ නව විෂය නිර්දේශ හඳුන්වා දීම හෝ පවත්නා විෂය නිර්දේශ සංස්කරණය කිරීම කරනු ලබයි. මෙමගින් විෂය නිර්දේශයේ අන්තර්ගතය කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස්කර ගැනීමටත් විෂය නිර්දේශය නව ආකෘතියකින් ඉදිරිපත් කිරීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පහසු හා සාර්ථක කරගන්නටත් අවස්ථාව සැලසේ.

අනූව දශකයේ දී ජාතික අරමුණු නවයක් හා පොදු නිපුණතා පහක් සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කොට ගෙන විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය කරණු ලැබිණ. මෙම සහශ්‍රකයේ විෂය නිර්දේශ සකස් කිරීමේදී යොදා ගන්නා ලද්දේ නිපුණතා පාදක ක්‍රමය යි. මෙම ක්‍රමය පාසල් අධ්‍යාපනයට හඳුන්වා දී දැනට වසර කීපයක් ම ගත වී හමාර ය. ඒ අනුව නවීන අධ්‍යාපන ක්‍රමවේදයක් වන නිපුණතා පාදක ඉගැන්වීම් ක්‍රමය පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ද හඳුන්වා දීම අපේ අරමුණ යි. පහත දැක්වෙන්නේ නිපුණතා පාදක ක්‍රමය පිළිබඳ පිළිගත් විග්‍රහයකි.

''කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළ අත්‍යවශ්‍ය විෂය කරුණු, මූලධර්ම හා ක්‍රමශිල්ප ප්‍රායෝගික ආකාරයෙන් සුසංයෝගී ලෙස යොදා ගැනීමේ හැකියාව නිපුණතාව යි.''

(අධ්‍යාපන විශ්වකෝෂය)

සැකෙවින් කිවහොත් නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී වී ගොඩනැගෙන ජීවිත පුරුද්දකි. ධනාත්මක ජීවිත පුරුදු ඇති කිරීම නිපුණතා පාදක විෂය නිර්දේශයක අරමුණ යි.

නිවැරදි පැහැදිලි හා විධිමත් විෂය නිර්දේශයක් ගුරුවරයාටත් ශිෂ්‍යයාටත් එක සේ වැදගත් වෙයි. විෂය නිර්දේශයෙන් පෙන්වා දෙන මාර්ගයේ ශිෂ්‍යයා කැඳවා ගෙන යාම ගුරුවරයාගේ කාර්යය යි. එම ගමන නිමා විය යුත්තේ ශිෂ්‍යයා විසින් ඉගෙනුම් පල අත්පත් කර ගැනීමෙනි. එවිට ශිෂ්‍යයාට මෙන් ම ගුරුවරයාට ද ඉගෙනුම් පල දැකීමෙන් සතුටට පත් විය හැකි ය.

කලකට පෙර පිරිවෙන් අධ්‍යාපනයට ම ආවේණික වූ විෂය නිර්දේශයක් විය. එහෙත් කාලයත් සමග පිරිවෙන් විෂය නිර්දේශය පාසල් විෂය නිර්දේශය තුළ නිමග්න වී ඇතුවා සේය. මේ නිසා ගිහි ශිෂ්‍යයාගේ අරමුණු හා ආකල්ප පැවිදි ශිෂ්‍යයාට ද නිරායාසයෙන් උරුම වෙමින් පවතී. ඒ හේතුවෙන් පැවිදි ශිෂ්‍යයා තමන්ට අදාළ ඉලක්ක වෙනුවට ගිහි ශිෂ්‍යයාගේ ඉලක්ක කරා ගමන් කිරීමෙන් ගමන නිමා වන බවක් දක්නට ලැබෙයි. මේ තත්ත්වය මත පාසල් අධ්‍යාපනයට අදාළ වූ විෂයයක් වුව ද පිරිවෙණේ ඉගැන්විය යුත්තේ පැවිද්දාට අදාළ ආකල්ප හා කුශලතා වර්ධනය කරවන පිරිවෙණට ම ආවේණික විෂය නිර්දේශයක් ඔස්සේ ය.

මේතාක් ලෝකයේ අධ්‍යාපන අරමුණු ප්‍රධාන වශයෙන් ඉලක්ක ගත වී පැවතියේ භෞතික දියුණුව සාර්ථක කර ගනු පිණිස ය. එහෙත් දියුණු ලෝකයේ රටවල් මේ වන විටත් එහි අනිසි විපාක අත්විඳිමින් සිටින බැවින් අනාගත ලෝකයේ අධ්‍යාපනික අරමුණු සකස් වෙමින් පවත්නේ භෞතික දියුණුව මෙන් ම ආධ්‍යාත්මික ශික්ෂණය ද අරමුණු කොට ගෙන ය. එබැවින් පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශ මගින් එකී අවශ්‍යතාව ඉටු කර ගැනීම අපගේ අරමුණයි.

මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඥාණරතන හිමි
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)

2016.12.14

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමා ගේ පණිවුඩය

ශ්‍රී ලංකාව තුළ බුද්ධ ධර්මය ස්ථාපිත වීමත් සමග ම විහාරාරාම ගොඩනැංවීම ආරම්භ විය. දිවයිනේ ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් "පිරිවෙණ" නමැති විද්‍යායතනය බිහි විය. පැවිදි ගිහි දෙපක්ෂයට ම අවශ්‍ය වූ කලා ශිල්ප, භාෂා හා සමය සමයාන්තර ඥානයත්, යහපත්, ගුණගරුක සමාජයක් බිහි කිරීමට අවශ්‍ය සාරධර්ම අධ්‍යාපනයත් බෙදා දුන්නේ පිරිවෙණ මගිනි. එම සාම්ප්‍රදායික අනන්‍යතාව රැක ගනිමින් ම, කාලීන අවශ්‍යතා ද සපුරාලමින් යහපත් සමාජයක් ගොඩනැඟීමේ කාර්යය ඉදිරියට ගෙන යාමට පිරිවෙණ ඉටු කරන කාර්යභාරය සුළු කොට තැකිය නොහැකි ය.

පිරිවෙණේ අධ්‍යාපනය ලබන පැවිදි ගිහි සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීමට සහ පරිවේණාචාර්යවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය ගුණාත්මක ව සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශ මුද්‍රණය කර ප්‍රථම වරට ලබා දීමට හැකිවීම ඉමහත් සතුටකි.

**අයි. එම්. කේ. බී. ඉලංගසිංහ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2016.12.14

# විෂය නිර්දේශ කමිටුව

| | |
|---|---|
| උපදේශකත්වය සහ අනුමැතිය | අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),<br>මහාචාර්ය, පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි,<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| විෂය විශේෂඥ උපදේශනය | ආනන්ද අබේසිරිවර්ධන<br>මහාචාර්ය, (විශ්‍රාමික) සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය<br>පූජ්‍ය මල්වානේ චන්දරතන හිමි,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය<br>පූජ්‍ය කුකුරුම්පොල ඤාණවිමල හිමි,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය.<br>අනුරින් ඉන්දිකා දිවාකර මිය,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය<br>එච්. එල්. එස්. අභයසිංහ මයා,<br>කථිකාචාර්ය (විශ්‍රාමික) සීතාවක භික්ෂු අභ්‍යාස විද්‍යාලය. |
| සම්බන්ධීකරණය | එල්.  ඒ. එස්. ප්‍රේමරත්න මයා<br>විෂය උපදේශක (සිංහල)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| ලේඛක මණ්ඩලය | පූජ්‍ය මාතලේ සුමනවංස හිමි<br>ගුරු උපදේශක (සිංහල) ගම්පහ දිස්ත්‍රික්කය.<br>එල්. ඒ. එස්. ප්‍රේමරත්න මයා<br>විෂය උපදේශක (සිංහල)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.<br>පී. එල්. ලලිත් අබේසේකර මයා<br>ගුරු උපදේශක (සිංහල) - නුවරඑළිය දිස්ත්‍රික්කය<br>අයි. ජී. ඩී. ආර්. ඉලුක්ගොඩ මයා<br>ගුරු උපදේශක (සිංහල) - කෑගල්ල දිස්ත්‍රික්කය<br>ටී. එස්. සී. ජයවර්ධන මයා<br>ගුරු උපදේශක (සිංහල) - කළුතර දිස්ත්‍රික්කය<br>විජේරත්න වනසුන්දර මයා<br>ගුරු උපදේශක (සිංහල) විශ්‍රාමික - කෑගල්ල දිස්ත්‍රික්කය |

# විෂය අධ්‍යයනයේ අරමුණු

01. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම.

02. සිංහල භාෂාවේ ව්‍යාකරණය සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

03. භාෂාවේ වාච්‍යාර්ථ, ලක්ෂ්‍යාර්ථ, ව්‍යාංග්‍යාර්ථ වටහා ගැනීම.

04. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථ ග්‍රහණ ශක්තිය වර්ධනය කරලීම.

05. අවබෝධය, විශ්ලේෂණය, සංස්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.

06. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම හා වාංමාලාව පෝෂණය කර ගැනීම.

07. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොටගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

08. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීම තුළින් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම.

09. විශ්වවිශ්‍රැත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු කිරීම.

11. සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

12. සන්නිවේදන කාර්යය පහසුකරලීම සඳහා සාම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරීම.

# විෂය හැඳින්වීම

අනාගත ලෝකයේ අභියෝග ජය ගැනීමට සමත් භාෂා ශාස්ත්‍ර, ගණිත මිනිත සහ ත්‍රිපිටක ඥානයෙන් පිරිපුන් සුපේෂල ශික්ෂාකාමී භික්ෂු පරපුරක් සහ ගුණ නැණ බෙලෙන් සුපෝෂිත වූ පූර්ණ පෞරුෂ සංවර්ධනයෙන් යුත් ගිහි දරු පිරිසක් රටට දායාද කිරීමේ කාර්යභාරය හා වගකීම වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය හමුවේ ඇති ප්‍රධාන අභියෝගයකි. මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආරම්භයේ සිට අඛණ්ඩ ව පැවත එන ආරාම කේන්ද්‍ර කරගත් සම්භාව්‍ය අධ්‍යාපන ආයතනය වූ පිරිවෙණ විවිධ කාලවකවානුවල දී වෙනස්වීම්වලට බඳුන් වෙමින් නොනැසී අද වන විටත් ශ්‍රී ලාංකික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට අවැසි ජන සමාජයක් නිර්මාණය කර ගැනීමට දායක වී ඇත.

වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත සහ 1980 අංක 01 දරණ පිරිවෙන් නියෝග මාලාවට අනුව ප්‍රතිව්‍යූහගත ව ක්‍රියාත්මක වන්නකි. පිරිවෙන් අධ්‍යාපන පනතෙහි සඳහන් එක් ප්‍රධාන පරමාර්ථයක් ලෙස '' භාෂා ශාස්ත්‍ර පිළිබඳ පරිපූර්ණ දැනුමක් '' පිරිවෙන් ශිෂ්‍යයා විසින් ලබාගත යුතු බව පැහැදිලි ව සඳහන් කර ඇත. ඒ අනුව අපගේ මව් බස ලෙසත්, අප අධ්‍යාපනය ලබන ප්‍රධාන මාධ්‍ය භාෂාව ලෙසත් සිංහල භාෂාව නිවැරැදි ව හැසිරවීමේ කුසලතාව අත්පත් කර ගැනීම පිරිවෙන් සිසුනට අනිවාර්ය වේ. එය අනාගත අභියෝග ජය ගැනීමට මහඟු පිටිවහලක් ද වේ.

සන්නිවේදන කාර්යයෙහි ලා මිනිසා විසින් යොදා ගනු ලබන ප්‍රබලතම මාධ්‍යය වන්නේ මනුෂ්‍ය භාෂාව යි. භාෂාව කවදා කෙසේ ඇතිවූවක් ද යන්න නිශ්චය කළ නොහැකි නමුදු එහි සංවර්ධනීය ක්‍රම විකාසනය පිළිබඳ විවිධ තොරතුරු ලද හැකි ය. මිහිපිට ජීවත් වන ජීවියෙකු විවිධ පාරිසරික විපර්යාසයන්ට අනුවර්තනය වෙමින් පැවත එන අතර එසේ වෙනස් වීමට නොහැකි ජීවීහු මිහිපිටින් තුරන් වී යති. එ නයින් භාෂාව ද විවිධ වෙනස්වීම්වලට හසුවෙමින් වර්ධනය වේ. එසේ නොවන යම් භාෂාවක් වේ නම් එය මළ භාෂාවක් වනවා නො අනුමාන ය.

සිංහලය ද යට කී පරිදි කාලයට, සමාජයට, පරිසරයට අනුව වෙනස් වෙමින් පෝෂණය වූ ජීව භාෂාවකි. එවන් බසක් ආකාර තුනකට පෝෂණය වේ. එනම් තත්සම ශබ්ද, තත්භව ශබ්ද සහ නිශ්පන්න ශබ්ද වලිනි. භාෂාවක ජීවමාන ගුණය රැක ගැනීමට මේ වෙනස්කම් අත්‍යවශ්‍ය වේ. භාෂා සංවර්ධන කාර්යය සඳහා මෙරට අධ්‍යාපන ධාරාවේ ගාමක බලවේගය වූ පිරිවෙණ විසින් සිදු කර ඇත්තේ අනුපමේය මෙහෙවරකි. විවිධ අධ්‍යාපන ක්‍රම සහ ආයතන ඔස්සේ භාෂාව සම්ප්‍රේෂණය වුව ද ඒ සියල්ල පිරිවෙන් අධ්‍යාපනයට දෙවෙනි වේ යැයි අපගේ හැඟීම යි.

පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයෙ හි භාෂාසාහිත්‍ය ඉගැන්වීමට වැඩි ඉඩකඩක් ලැබීම එදාමෙදා තුර නොවෙනස් ව පවතින ප්‍රවණතාවකි. පාලි, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි, දෙමළ ආදී භාෂා රැසක් අනිවාර්යයෙන් ඉගෙන ගැනීමට පිරිවෙන් ශිෂ්‍යයා යොමු කර තිබීමෙන් එය පැහැදිලි වේ. ඒ අතරින් අපගේ මව් භාෂාව වන සිංහල භාෂාව නිවැරැදි ව හැදෑරීමෙන් නූතන සාහිත්‍ය කෘති පමණක් නොව සම්භාව්‍ය පුරාතන ගද්‍ය පද්‍ය ග්‍රන්ථ හොඳින් පරිශීලනය කිරීමට හැකි වන අතර එමගින් ලබා ගන්නා දැනුම භාවිතයට සහ නිර්මාණ කරනයට යොදා ගැනීමට ද පිළිවන. පිරිවෙන් ශිෂ්‍යයාගේ භාෂා කුසලතා ප්‍රවර්ධනය කිරීම මෙම නව විෂය නිර්දේශයේ ඇතුළත් සකලාංගයන්ගේ ඒකායන අරමුණයි.

මේ වන තෙක් පිරිවෙන් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වූ විෂය නිර්දේශය හොඳින් අධ්‍යායනය කර එහි මූලික හරයන් ආරක්ෂා වන ලෙසත්, නව අධ්‍යාපන ව්‍යවහාරයන්ට ගැළපෙන ලෙස නවාංගයන් එකතු කර ගැනීමත් සිදු කෙරිණි. විශේෂයෙන් වර්තමානයේ ක්‍රියාත්මක වන නිපුණතා පාදක අධ්‍යාපනය සහ ක්‍රියාකාරකම් පාදක ඉගෙනුමට ගැළපෙන ලෙස විෂය නිර්දේශය ප්‍රතිසංවිධානය වී ඇත. ඒ අනුව පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිපත්තිවලට අනුගත ව ආවේණික අනන්‍යතාව හා වටිනාකම්, ගුණාත්මය ආරක්ෂා කර ගෙන නව දැනුම් සම්භාරයකින් සමස්ත ඡාත්‍ර ප්‍රජාව පෝෂණය කිරීම අරමුණු කරගෙන මෙම නව නිපුණතා පාදක විෂය නිර්දේශය හඳුන්වා දෙන්නේ භාෂා ශාස්ත්‍රෝන්නතිය පරමාධ්‍යාසය කර ගනිමිනි. විෂයභාර පරිවේණාචාර්යවරු මේ පිළිබඳ ව තුලනාත්මක හැදෑරීමක් සිදු කොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීම සුදුසු යැයි අදහස් කරමි.


**එල්.ඒ.එස්. ප්‍රේමරත්න**

**විෂය උපදේශක (සිංහල)**

**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**

**අධ්‍යාපන අමාත්‍යාංශය**


**2016.12.14**

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය
# 1 ශ්‍රේණිය - සිංහල

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01.<br>අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 1.1 අක්ෂර මාලාව නිවැරදි ලෙස උච්චාරණය කරයි.<br><br>1.2 අක්ෂර මාලාව හඳුනා ගෙන නිවැරදි ව ලියයි.<br><br>1.3 අක්ෂර මාලාවේ රටාව හඳුනා ගෙන නිවැරදි ව අක්ෂර ස්ථානගත කර ලියයි. | • **අක්ෂර මාලාව :**<br>කියවීම, ලිවීම, උච්චාරණය<br>(සාමාන්‍ය හැඳින්වීමක්)<br>අකාරාදී පිළිවෙළ | • සිංහල අක්ෂර මාලාව නිවැරදි ව ශබ්ද නගා කියවයි.<br>• සිංහල අක්ෂර හඳුනා ගෙන නිවැරදි ව ලියයි.<br>• සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන අනුපිළිවෙළින් ලියයි.<br>• අකාරාදී පිළිවෙළට වචන පෙළගස්වයි.<br>• ශබ්දකෝෂයක පද පෙළගැස්ම පිළිබඳ ව අදහස් දක්වයි. | 6 |
| 02.<br>ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී. | 2.1 නාම පද පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.<br><br>2.2 ආඛ්‍යාත පද පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛනයේ නිරත වෙයි. | • **නාමපද**<br>ප්‍රාණවාචී අප්‍රාණවාචී භේදය,<br>වචන භේදය, ලිංග භේදය, පුරුෂ භේදය,<br>උක්තානුක්ත භේදය, සර්වනාම පද (මූලික අවබෝධයක්)<br>• **ආඛ්‍යාත පද**<br>කාල භේදය (අතීත, වර්තමාන, අනාගත)<br>වචන භේදය (ඒකවචන, බහුවචන)<br>පුරුෂ භේදය (ප්‍රථම, මධ්‍යම, උත්තම)<br>ලිංග භේදය (ස්ත්‍රී, පුරුෂ, නපුංසක)<br>සකර්මක අකර්මක භේදය<br>(මූලික අවබෝධයක්) | • නාම පද යනු කුමක්දැයි නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• නාම පද, ලිංග භේදය අනුව වෙන්කර දක්වයි.<br>• නාම පදවල පුරුෂ භේදය හඳුනා ගෙන නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද වෙන් කර දක්වයි.<br>• උක්ත අනුක්ත වශයෙන් නාම පද වෙන් කර දක්වයි.<br>• නාම පද අතුරින් සර්වනාම පද වෙන් කරයි. | 18 |

| | | | | |
|---|---|---|---|---|
| | 2.3 ව්‍යාකරණානුකූල ව සරල වාක්‍ය නිර්මාණය කරයි. | • **වාක්‍ය නිර්මාණය** :<br>සරල වාක්‍ය නිර්මාණය | • ක්‍රියාපද කාල තුනට අනුව නිවැරදි ව වෙන් කරයි.<br>• ඒකවචන බහුවචන ක්‍රියා පද නිවැරදි ව හඳුනා ගෙන ලියයි.<br>• පුරුෂ තුනට අයත් ක්‍රියාපද නිවැරදි ව වෙන් කර දක්වයි.<br>• සකර්මක හා අකර්මක ක්‍රියාපද වෙන් කර දක්වයි.<br>• උක්තය හා කර්මය ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය නිර්මාණය කරයි. | |
| 03.<br>භාෂා ක්‍රියාකාරකම් මගින් වාං මාලාව පෝෂණය කරගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනී. | 3.1 විවිධාර්ථවත් පද භාෂා කාර්යයන්හි දී අර්ථවත් ලෙස යොදා ගනී. | • **විවිධාර්ථවත් පද**<br>සමානාර්ථවත් පද, විරුද්ධාර්ථවත් පද, බහ්වර්ථවත් පද<br>(මූලික අවබෝධය) | • සමානාර්ථවත් හා විරුද්ධාර්ථවත් පද ගෙන භාෂාකරණයේ යෙදේ.<br>• බහ්වර්ථවත් පද හඳුනා ගෙන විස්තර කරයි.<br>• බහ්වර්ථවත් පද යොදා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරයි. | 06 |

| | | | | |
|---|---|---|---|---|
| 04.<br>අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 මාතෘකාවකට අනුව සරල වාක්‍ය ගොඩනගයි.<br><br>4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. | • **රචනය**<br>මාතෘකාවක් යටතේ සරල වාක්‍ය ගොඩනැගීම.<br><br>• **විරාම ලක්ෂණ**<br>වාක්‍ය අවසානයේ යෙදෙන විරාම ලක්ෂණ.<br>★ නැවතීමේ තිත<br>★ ප්‍රශ්නාර්ථ ලකුණ<br>★ විස්මයාර්ථ ලකුණ | • මාතෘකාවකට අනුව සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>• විරාම ලක්ෂණ අනුව සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>• වාක්‍යයක අවසානයක යෙදෙන්නේ නැවතීමේ තිත බව කියයි.<br>• ප්‍රශ්නයක් ඇගවීමේ දී ප්‍රශ්නාර්ථ ලකුණ යොදයි.<br>• විස්මයක් ඇඟවීම සඳහා විස්මයාර්ථ ලකුණ භාවිත කරයි. | 09 |
| 05.<br>ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 5.1 නිරවුල් හා පැහැදිලි අදහස් ඇති ව ලේඛනයේ යෙදෙයි. | • **ප්‍රායෝගික ලේඛන**<br>පෞද්ගලික ලිපි ලිවීම, වාර්තා ලිවීම. | • අවශ්‍යතා සඳහා පෞද්ගලික ලිපියක් නිවැරදි ව ලියයි.<br>• සිදු වූ දෙය එලෙසින් ම වූ බව ප්‍රකාශ කිරීමට වාර්තා ලියයි.<br>• පෞද්ගලික ලිපියක් නියමිත ආකෘතියට අනුව සකසයි.<br>• වාර්තාවකට අත්‍යවශ්‍ය මූලිකාංග නම් කරයි | 06 |
| 06.<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී. | 6.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.<br>6.2 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.<br>6.3 විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>(හීන්සැරය නවකතාවේ සියලු පරිච්ඡේද, ලෝවැඩසඟරාවේ මුල් පද්‍ය 50, නම්පොත )<br><br>★ නිවැරදි වචන උච්චාරණය<br>★ විරාම ලකුණු ගැන අවධානය<br>★ නිසි හඬ පාලනය | • හීන්සැරය නවකතාවේ තෝරාගත් කොටස් නිවැරදි ව උච්චාරණයෙන් හා විරාම ලක්ෂණ සලකා කියවයි.<br>• ලෝවැඩ සඟරාවේ පද්‍ය නිශ්ශබ්ද ව කියවා අර්ථ අවබෝධය නිවැරදි ව ලියයි.<br>• සාහිත්‍ය සමිතියේ දී ජාතක කතා කොටසක් නිවැරදි ව ශබ්ද නගා කියවයි. | 24 |

| | | | | |
|---|---|---|---|---|
| | 6.4 ගද්‍ය හා පද්‍ය කියවා වටහාගත් බව ප්‍රකාශ කරයි. | • **අර්ථාවබෝධය**<br>සරල ගද්‍ය, පද්‍ය පාඨයක අර්ථය වටහා ගැනීම. | • ලෝවැඩ සඟරාවේ පද්‍ය තාලානුකූල ව ගයයි.<br>• නම්පොතේ ස්ථාන නාම කටපාඩමෙන් කියයි. | |
| 07.<br>ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය ඔස්සේ ආගමික සමාජයීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම සඳහා වනපොත්කරණයේ යෙදෙයි. | 7.1 නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරාගත් ගද්‍ය කොටස් හා පද්‍ය වනපොත් කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>(ලෝවැඩ සඟරාවේ මුල් පද්‍ය 50, හීන්සැරය නවකතාවේ සියලු පරිච්ඡේද) | • ලෝවැඩ සඟරාවේ දක්වෙන උපදේශනයන් ප්‍රායෝගික ජීවිතයේ දී යොදා ගනී.<br>• ලෝවැඩ සඟරාවේ පද්‍ය කියවා ධර්මාවබෝධය පුළුල් කර ගැනීමට භාවිත කරයි.<br>• හීන්සැරය නවකතාවේ තෝරාගත් කොටස් සාමාජයීය අවශ්‍යතා සඳහා යොදා ගනි. | 24 |
| 08.<br>රසඥතාව වර්ධනය කරගැනීම හා ජීවිතාදර්ශ ලබා ගැනීම සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 8.1 ගද්‍ය හා පද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>(ලෝවැඩ සඟරාවේ මුල් පද්‍ය 50, නම්පොත සහ මඟුල් ලකුණ) | • ගද්‍ය හා පද්‍ය කොටස් කියවා එහි රසමුසු තැන් ප්‍රකාශ කරයි.<br>• නියමිත පද්‍ය කොටස් තාලයට ගායනා කරයි. | 18 |
| 09.<br>අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | 9.1 සරල පද්‍ය නිර්මාණය කරයි.<br><br>9.2 සරල කතාන්දරයක් නිර්මාණය කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • සරල කතන්දර නිර්මාණය කර බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරයි.<br>• සරල පද්‍ය පන්ති නිර්මාණය කර සාහිත්‍ය සමිතියට ඉදිරිපත් කරයි.<br>• පුවත්පත් සඳහා සරල පද්‍ය පන්ති සහ කතන්දර නිර්මාණය කරයි. | 15 |
| 10.<br>සන්නිවේදනය සාර්ථක කර ගැනීම | 10.1 සරල සංවාදයකට සවන් දී අදහස් ප්‍රකාශ කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • දැනුම ,ආකල්ප හා කුසලතා වර්ධනයට විද්‍යුත් මාධ්‍ය | |

| | | | | |
|---|---|---|---|---|
| සඳහා ශ්‍රවණ කුසලතා ව ඵලදායී ලෙස යොදාගනී. | 10.2 විවිධ ප්‍රකාශනවලට සවන් දී අන්තර්ගතය ග්‍රහණය කර ගනියි.<br>10.3 ආචාරශීලී ව හා සංයමයෙන් යුතුව සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>10.4 විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු ප්‍රායෝගික භාෂා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා යොදා ගනියි. | | නිර්මාණ ඇසුරු කරයි.<br>• නිහඬ ව අසා සිටීමෙන් පසු වඩා හොඳින් පිළිතුරු ලබා දිය හැකි බව ප්‍රකාශ කරයි.<br>• ප්‍රවෘත්ති ප්‍රකාශවලට සවන් දී වැදගත් පුවත් උපුටා දක්වයි. | 24 |
| 11.<br>තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතාව ප්‍රදර්ශනය කරයි. | 11.1 සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි.<br>11.2 අවස්ථාවට උචිත ලෙස ශ්‍රාවකයා ආකර්ෂණය කර ගනිමින් කතා කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • මාතෘකාණුකූල ව නිශ්චිත කාලයක් තුළ කතාවක් ඉදිරිපත් කරයි.<br>• තමා ලත් අත්දැකීමක් ඇසුරෙන් තනාගත් කතාවක් සබකෝලයෙන් තොරව ඉදිරිපත් කරයි.<br>• සුවිශේෂ චරිත කතා සාහිත්‍ය සමිතියේ දී ඉදිරිපත් කරයි. | 15 |
| 12.<br>භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය, සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි. | 12.1 සංස්කෘතික උරුමය හා හර පද්ධතීන් පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.<br>12.2 කියවීම මගින් සමාජ සාරධර්ම චරිතායනය කර ගනියි.<br>12.3 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ පරිශීලනය කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • දේශාභිමානී කවි ගීත අසා ජාතික උරුමය පිළිබඳ ව අභිමානයෙන් කතා කරයි.<br>• දේශයට මෙහෙවරක් කළ අභිමානවත් චරිත කථා කියවා, තම චරිතය ගොඩනගා ගත යුතු බව ප්‍රකාශ කරයි.<br>• දේශාභිමානය දනවන නිර්මාණ රැස් කරයි. | 15 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ :**

- සිංහල 1 - මූලික පිරිවෙණ - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- නම්පොත සහ මඟුල් ලකුණ
- ලෝවැඩ සඟරාවේ මුල් කවි 50
- හීන්සැරය - කුමාරතුංග මුනිදාස

**විෂය සමගාමී ක්‍රියාකාරකම් :**

සාහිත්‍ය සමිතිය, බිත්ති පුවත්පත් නිර්මාණය, සඟරා නිර්මාණ, සිංහල භාෂා දින සැමරුම්, ප්‍රදර්ශන, පුස්තකාල පරිහරණය

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය
# 2 ශ්‍රේණිය - සිංහල

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01.<br>අක්ෂරමාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 1.1 ඒ ඒ අක්ෂර අයත් ප්‍රභේද ලියා දක්වයි.<br><br>1.2 අල්පප්‍රාණ, මහාප්‍රාණ භේදය හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.<br><br>1.3 ලේඛන කාර්යයේ දී අකාරාදී පිළිවෙළ භාවිත කරයි. | • **අක්ෂර මාලාව** :<br>කියවීම, ලිවීම, උච්චාරණය<br>(සාමාන්‍ය හැඳින්වීමක්)<br>• **අකාරාදී පිළිවෙළ** | • අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන ශබ්ද නගා උච්චාරණය කරයි.<br>• අක්ෂර මාලාව සම්මත හැඩ අනුව ලියයි.<br>• අක්ෂර වින්‍යාසය අනුව අල්පප්‍රාණ, මහාප්‍රාණ භේදය හඳුනා ගෙන භාවිත කරයි.<br>• භාෂා ව්‍යවහාරයේ දී අකාරාදී පිළිවෙළ ප්‍රායෝගික ව භාවිත කරයි.<br>• අකාරාදී පිළිවෙළට පද පෙළගස්වයි. | 11 |
| 02.<br>ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී. | 2.1 නාමපද පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.<br>2.2 ආඛ්‍යාත පද පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.<br>2.3 නාම විභක්ති පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.<br><br>2.4 නිපාත, උපසර්ග පද පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.<br><br>2.5 නෛපාතික කෘදන්ත පද පිළිබඳ ව අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි. | • **නාමපද හා නාම ප්‍රභේද** :<br>ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා<br>**නාම විභක්ති** : ප්‍රථමා, කර්ම, කර්තෘ, කරණ ආදී විභක්ති අනුව වචන භේදය, ලිංග භේදය<br>**සර්වනාම** : පෞරුෂ සර්ව නාම පද, ප්‍රශ්න වාචක සර්වනාම වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය.<br>• **නිපාත** : සමුච්චයාර්ථ, සහ අර්ථ, ප්‍රශ්නාර්ථ, ඛේදාර්ථ, කාලාර්ථ<br>• **උපසර්ග** : උපසර්ග යෙදීමෙන් කෙරෙන කාර්ය අර්ථයට අනුව, අර්ථය විසිතුරු කිරීම, අර්ථයට බාධා කිරීම, අර්ථයය තීව්‍ර කිරීම, අර්ථය වෙනස් කිරීම. | • නාම සහ නාම ප්‍රභේද හැඳින විස්තර කරයි.<br>• විභක්ති, වචන, ලිංග අනුව නාම පද වර්ගීකරණය කරයි.<br>• සර්ව නාම පද විශේෂයෙන් හඳුනාගෙන තොරතුරු කියයි.<br><br>• නිපාත සහ උපසර්ග පිළිබඳ ව අවබෝධයෙන් ලේඛන කටයුතු සිදුකරයි.<br>• විධි ක්‍රියා ආඛ්‍යාත පද ලෙස භාවිත කළ හැකි බව ප්‍රකාශ කරයි. | 30 |

| | | | | |
|---|---|---|---|---|
| | 2.6 මූලික රීතිවලට අනුව උක්තාඛ්‍යාත ගළපා වාක්‍ය නිර්මාණය කරයි. | • **ආඛ්‍යාත පද** : කාල භේදය, වචන භේදය, පුරුෂ භේදය, විධි ක්‍රියා<br>• **නේපාතික කෘදන්ත** : පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා (මූලික අවබෝධය)<br>• **කාරක** : කර්තෘකාරක, කර්මකාරක, භාවකාරක (මූලික අවබෝධය) | • නේපාතික කෘදන්ත පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියාවල යෙදෙන බව ප්‍රකාශ කරයි.<br>• උක්තාඛ්‍යාත රීතිවලට අනුව නිවැරදි ව වැකි ලියයි. | |
| 03.<br>භාෂා ක්‍රියාකාරකම් මගින් වාග් මාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනී. | 3.1 විවිධාර්ථවත් පද භාෂා කාර්යයන්හි දී අර්ථවත් ලෙස යොදා ගනී. | • **විවිධාර්ථවත් පද**<br>සමානාර්ථ, විරුද්ධාර්ථ, බහ්වර්ථ (ප්‍රමාණවත් අවබෝධය) | • සමානාර්ථ, විරුද්ධාර්ථ, බහ්වර්ථ පද පිළිබඳ ව නිවැරදි අවබෝධයෙන් ලේඛනයේ යෙදෙයි.<br>• විරුද්ධාර්ථ, බහ්වර්ථ පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි | 03 |
| 04.<br>අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් නිවැරදි ව අදහස ඉදිරිපත් කරයි.<br><br>4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.<br><br>4.3 පාඨයක අන්තර්ගතය නිවැරදි ව සාරාංශ කරයි. | • **වාක්‍ය නිර්මාණය** :<br>⋆ උක්තාඛ්‍යාත සම්බන්ධය<br>⋆ සරල වාක්‍ය හා සංකීර්ණ වාක්‍ය<br>⋆ කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය<br>• **රචනය** : මාතෘකාවට අදාළ කෙටි රචනා<br>• **සාරාංශ කරණය** : මූලික සිද්ධාන්තවලට අනුව සරල ගද්‍ය කොටසක් සාරාංශ කිරීම.<br>• **විරාම ලක්ෂණ** : කොමාව, තිත්කොමාව, වරහන්, උද්ධෘත පාඨ | • සරල හා සංකීර්ණ රීති සහිත ව උක්තාඛ්‍යාත සම්බන්ධතා ඇති වාක්‍ය නිර්මාණය කරයි.<br>• භාෂා භාවිතයේ දී විශ්ලේෂණ හා සංස්ලේෂණ ශක්‍යතා ප්‍රකට කරයි.<br>• විරාම ලක්ෂණ උචිත පරිදි යෙදීම භාෂා සාලංකරණයට බලපාන බව ප්‍රකට කරයි.<br>• කර්තෘකාරක වාක්‍යයක ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• කර්මකාරක වාක්‍යයක ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 18 |

| | | | | |
|---|---|---|---|---|
| 05.<br>ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 5.1 නිවැරදි ව හා නිර්මාණශීලී ව ආරාධනා පත්‍ර, දැන්වීම්, පත්‍රිකා, සුබපැතුම් පත් සකස් කරයි. | • **ප්‍රායෝගික ලේඛන** :<br>ආරාධනා පත්, දැන්වීම්, සුබපැතුම් පත් | • ප්‍රායෝගික අවශ්‍යතා සඳහා විවිධ ලේඛන නිර්මාණාත්මක ව හා නිවැරදි ව භාවිත කරයි.<br>• ආරාධනා පත්‍රයක විවිධ ආකෘති විස්තර කරයි.<br>• දැන්වීමක මූලිකාංග ප්‍රකාශ කරයි.<br>• නිර්මාණාත්මක සුබ පැතුම්පත් සකස් කරයි. | 06 |
| 06.<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී. | 6.2 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.<br>6.2 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.<br>6.3 විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.<br>6.4 පොත පත කියවීමෙන් ධාරණය කරගත් කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.<br>6.5 ගද්‍ය පද්‍ය පාඨ කියවා අර්ථය වටහාගත් බව ප්‍රකට කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>සුභාෂිතයේ මුල් පද්‍ය 40<br>සකස්කඩ<br>• **අර්ථාවබෝධය**<br>ගද්‍ය පද්‍ය පාඨයක වාච්‍යාර්ථය හා සමස්තාර්ථය වටහා ගැනීම. | • නිර්දිෂ්ට ග්‍රන්ථ හා අනිර්දිෂ්ට පොත පත අර්ථාවබෝධය ලබමින් නිශ්ශබ්දව කියවයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථවල ගද්‍ය පද්‍ය පාඨ විවිධ ශෛලීන්ට අනුව කියවයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථ කියවීම සඳහා සාම්ප්‍රදායික දේශන ක්‍රම භාවිත කරයි.<br>• භාෂා හා සාහිත්‍ය සමිති ආදී විවිධ සමගාමී ක්‍රියාකාරකම්වල දී විවිධ ලේඛන කියවීම් අංග ලෙස ඉදිරිපත් කරයි.<br>• කියවීමෙන් ලද දැනුම උචිත අවස්ථාවල දී නිවැරදි ව භාවිත කරයි. | 21 |
| 07.<br>ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය කර ගනිමින් ආගමික සාමාජීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම සඳහා වනපොත් කරණයේ යෙදෙයි. | 7.1 නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරාගත් ගද්‍ය කොටස් හා පද්‍ය වනපොත් කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>සුභාෂිතයේ මුල් පද්‍ය 40<br>ගණදෙවි හැල්ල, වදන් කවි පොත | • ඉගෙනුම් ඇගයීම් අවශ්‍යතා සඳහා නිර්දිෂ්ට ග්‍රන්ථවල ගද්‍ය පද්‍ය පාඨ වනපොත් කරයි.<br>• ධර්මදේශනා වැනි ප්‍රායෝගික අවස්ථාවල දී නිර්දිෂ්ට ග්‍රන්ථවලින් වනපොත් කළ කොටස් භාවිත කරයි. | 18 |

| | | | | |
|---|---|---|---|---|
| 08.<br>රසඥතාව වර්ධනය කර ගැනීම හා ජීවිතාදර්ශ ලබා ගැනීම සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 8.1 ගද්‍ය හා පද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>අඹයහළුවෝ නව කතාව | • සාහිත්‍ය රසඥතා වර්ධනයට නිර්දිෂ්ට ග්‍රන්ථ භාවිත කරයි.<br>• ජීවිත පරිඥානය උදෙසා සාහිත්‍ය රසවින්දනය ඉවහල් වන බව පැහැදිලි කරයි.<br>• අඹයහළුවෝ නව කතාවේ රසවත් අවස්ථා අනුකරණය කරයි. | 12 |
| 09.<br>අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | 9.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.<br><br>9.2 නිර්මාණාත්මක කතා රචනා කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • ආයතනික අන්‍යෝන්‍ය සන්නිවේදනය සඳහා නිර්මාණකරණයේ නියැලෙයි.<br>• විෂය සමගාමී ක්‍රියාකාරකම්වල දී විවිධ නිර්මාණාත්මක ප්‍රබන්ධ ඉදිරිපත් කරයි.<br>• ස්වනිර්මාණ සංග්‍රහයක් සකස් කරයි. | 12 |

| | | | | |
|---|---|---|---|---|
| 10.<br>සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතාව ඵලදායී ලෙස යොදා ගනී. | 0.1 විවිධ නිර්මාණවලට සවන් දී අන්තර්ගතය ග්‍රහණය කර ගනියි.<br>0.2 විවිධ නිර්මාණවලට හා ප්‍රකාශනයන්ට සවන් දී ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව ප්‍රතිචාර දක්වයි.<br>10.3. සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි.<br>10.4. විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු, භාෂා කාර්යයන් ප්‍රායෝගිකව ඉටු කර ගැනීම සඳහා යොදා ගනියි.<br>10.5. දේශන, සාකච්ඡා ආදියට සවන් දීමේ පුරුද්ද මගින් විචාරශීලී ව භාෂාව හැසිරවීමේ කුසලතාව ලබා ගනියි.<br>10.6. විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්**<br>සුභාෂිතයේ මුල් පද්‍ය 40<br>අඹයහළුවෝ නව කතාව | • නිරාකුල අර්ථාවබෝධයක් සඳහා නිවැරදි ශ්‍රවණයක් සහිතව නිර්දිෂ්ට ග්‍රන්ථ පාඨ පරිශීලනය කරයි.<br>• සංයමයෙන් යුතු ව විවිධ විද්‍යුත් වැඩ සටහන්වලට සවන් දෙයි.<br>• විචාරශීලී ව සවන් දීම නිවැරදි භාෂා ව්‍යවහාරය සඳහා යෝග්‍ය බව ප්‍රකාශ කරයි.<br>• ප්‍රවෘත්තිවලට සවන් දී අන් අයට නිවැරදි ව සන්නිවේදනය කරයි.<br>• උසස් සාහිත්‍ය නිර්මාණ ඇසුරු කිරීමට කැමැත්ත ප්‍රකාශ කරයි.<br>• සාහිත්‍ය නිර්මාණවල ප්‍රබල චරිතවල සාධනීය ගුණාංග චරිතායනය කරයි. | 21 |
| 11.<br>තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ප්‍රදර්ශනය කරයි. | 11.1. සබකෝලයෙන් තොරව අදහස් ප්‍රකාශ කරයි.<br>11.2. කරුණු සංවිධානය කර ගනිමින් නිරවුල් ව හා පැහැදිලි ව කථනයේ යෙදෙයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • විවිධ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල දී කථන කුසලතා මතු වන සේ කතා ඉදිරිපත් කරයි.<br>• අන්‍යෝන්‍ය සම්බන්ධතා වර්ධනය සඳහා කථන කුසලතා ව බෙහෙවින් පාදක වන ප්‍රකාශ කරයි.<br>• ආයතනයික විවිධ උත්සව අවස්ථාවල දී තම අදහස් අන් අයට නිරවුල් ව, තර්කානුකූල ව ඉදිරිපත් කරයි. | 18 |

| | | | | |
|---|---|---|---|---|
| 12.<br>භාෂා භාවිතය මගින් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි. | 12.1. සංස්කෘතික උරුමය හා හර පද්ධතීන්වල අගය හා වටිනාකම පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.<br><br>12.2. කියවීම මගින් සමාජ සාරධර්ම චරිතායනය කර ගනියි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්**<br>• සුභාෂිතයේ මුල් පද්‍ය 40<br>• අඹයහළුවෝ නව කතාව | • අඹයහළුවෝ නව කතාවෙන් ප්‍රකට වන සමාජ විෂමතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අඹයහළුවෝ නව කතාවේ ඇතුළත් චරිත ඇසුරෙන් සාරවත් චරිතාදර්ශන ලබයි.<br>• සුභාෂිතයේ එන උපදේශයන් චරිතායනය කර ගනියි. | 15 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ :**

- සිංහල 2 - මූලික පිරිවෙණ - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- සුභාෂිතය මුල් කවි 40
- වදන් කවි පොත, ගණදෙවි හෑල්ල
- සකස්කඩ (අතිරේක ව පංතියේ කියවීම සඳහා)
- අඹයහළුවෝ - ටී. බී. ඉලංගරත්න

**විෂය සමගාමී ක්‍රියාකාරකම් :**

සාහිත්‍ය සමිතිය, බිත්ති පුවත්පත් නිර්මාණය, සඟරා නිර්මාණ, සිංහල භාෂා දින සැමරුම්, ප්‍රදර්ශන, පුස්තකාල පරිහරණය

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය
# 3 ශ්‍රේණිය - සිංහල

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01.<br>අක්ෂරමාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 01.1. ඒ ඒ අක්ෂර අයත් ප්‍රභේද ලියා දක්වයි.<br>01.2. න, ණ, ල, ළ භේදය හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි. | • **අක්ෂර මාලාව :**<br>⋆ අක්ෂර ප්‍රභේද :<br>වර්ගාන්තාක්ෂර, ඝෝෂ, අඝෝෂ, අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර, සඤ්ඤකාක්ෂර, අක්ෂර උත්පත්ති ස්ථාන.<br>⋆ අක්ෂර වින්‍යාසය :<br>න, ණ, ල, ළ භේදය | • ඝෝෂ අඝෝෂ අක්ෂර හඳුනා ගෙන වෙන් කර වගුගත කරයි.<br>• අන්තඃස්ථාක්ෂරවල උච්චාරණ ස්වභාවය හඳුනා ගෙන ප්‍රකාශ කරයි<br>• ඌෂ්මාක්ෂර හා සඤ්ඤකාක්ෂර නිවැරදි ව ස්ථාන ගත කරයි.<br>• වර්ගාක්ෂර යන්න පැහැදිලි කරයි.<br>• න, ණ, ල, ළ භේදය හඳුනා ගෙන නිවැරදි ලේඛනයේ යෙදෙයි. | 16 |
| 02.<br>ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී. | 02. 1. ලේඛනයේ දී නිවැරදි පද සාධනය භාවිත කරයි.<br>02.2. ලිංග භේදය පිළිබඳ ව සවිස්තරාත්මක ව පැහැදිලි කරයි.<br>02.3. අව්‍ය පද නිවැරදි ව වාක්‍යවල යොදයි.<br>02.4. ලේඛනයේ දී ආඛ්‍යාත, විභක්ති ප්‍රත්‍ය හා නාම විභක්ති ප්‍රත්‍ය නිවැරදි ව යොදා ගනී.<br>02.5. සම්මත රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.<br>02.6. කතෘකාරක කර්මකාරක යෝගයේ සම්මත රීති ලියා දක්වයි. | • **සන්ධි, ලිංග, සමාස, තද්ධිත, කෘදන්ත ආදී ව්‍යාකරණාංග පිළිබඳ ව මූලික අවබෝධය.**<br>• **ආඛ්‍යාත, විභක්ති ප්‍රත්‍යය හා නාම විභක්ති ප්‍රත්‍යය පිළිබඳ ව සාමාන්‍ය අවබෝධය.**<br>• **නෛපාතික කෘදන්ත :**<br>ආවස්ථික ක්‍රියා (අසම්භාව්‍ය) පිළිබඳ ව මූලික අවබෝධය<br>• **ආඛ්‍යාත පද :**<br>ප්‍රයෝජ්‍ය, ප්‍රාර්ථනා ක්‍රියා පිළිබඳ ව මූලික අවබෝධය | • සිංහල පද සාධනය නිවැරදි ව කරයි.<br>• ලිංග භේදය හා ඒ අනුව ක්‍රියාපද යෙදෙන අයුරු හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.<br>• අව්‍ය පද හඳුනා ගෙන වාක්‍යවල යොදයි.<br>• නාමපදවල හා ආඛ්‍යාත පදවල ප්‍රකෘති හා ප්‍රත්‍ය ප්‍රභේද පිළිබඳ ව අවබෝධයෙන් යුක්ත ව වාක්‍යවල යොදයි.<br>• සම්මත රීති අනුව ව්‍යාකරණානුකූල වාක්‍ය නිර්මාණය කරයි. | 31 |

| | | | | |
|---|---|---|---|---|
| | 02.7. නෛපාතික කෘදන්ත යනු මොනවාදැයි පැහැදිලි කරයි. | ● අව්‍යය පද :<br>නිපාත, උපසර්ග පිළිබඳව සවිස්තරාත්මක අවබෝධය. | ● නෛපාතික කෘදන්ත ප්‍රභේද හා ඒවායේ විශේෂතා අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.<br>● සදොස් වාක්‍ය නිදොස් කරයි. | |
| 03.<br>භාෂා ක්‍රියාකාරකම් මගින් වාං මාලාව පෝෂණය කරගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි. | 03.1. සාම්ප්‍රදායික යෙදුම් භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස යොදා ගනී.<br>03.2. භාෂා ව්‍යවහාරය හඳුනාගනිමින් සන්නිවේදනයේ නිරත වෙයි. | ● **සාම්ප්‍රදායික යෙදුම්** :<br>ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ<br>(මූලික අවබෝධය) | ● සාම්ප්‍රදායික යෙදුම්වලට අදාළ ප්‍රභේද වර්ග කරයි.<br>● සන්නිවේදනය කාර්යක්ෂම කර ගැනීමට සාම්ප්‍රදායික යෙදුම් විශාල පිටිවහලක් වන බව පවසයි.<br>● ඉඟි වැකි සහ ප්‍රස්තාව පිරුළු අතර වෙනස පහදයි | 06 |
| 04.<br>අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 04.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් නිරවුල් ව ඉදිරිපත් කරයි.<br>04.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.<br>04.3. පාඨයක අන්තර්ගතය හකුළුවා ව්‍යක්ත ලෙස ඉදිරිපත් කරයි. | ● **වාක්‍ය නිර්මාණය** :<br>⋆ උක්තාඛ්‍යාත යෝගය පිළිබඳ රීති<br>⋆ කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය<br>● **රචනය** : මාතෘකාවට අදාළ දීර්ඝ රචනා<br>● **සාරාංශය** :සාරාංශකරණය පිළිබඳ ව රීති ඇසුරින් මූලික අධ්‍යයනය<br>● **විරාම ලක්ෂණ** :ඇල ඉර, දෙතිත, තිත්පෙළ | ● මාතෘකාවට අදාළ වන පරිදි භාෂා රීති අනුගමනය කරමින් අදහස් නිවැරදි ව හා තර්කානුකූල ව ඉදිරිපත් කරයි.<br>● කථනයේ විවිධතා ලේඛනය තුළින් ශිල්පීය ක්‍රම මගින් විදහා දක්වයි.<br>● පාඨයක අන්තර්ගතය ග්‍රහණය කර ගනිමින් ප්‍රතිචාර දක්වයි. | 20 |
| 05.<br>ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 05.1. නිරවුල් හා සංක්ෂිප්ත ලෙස ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | ● **ප්‍රායෝගික ලේඛන** :<br>රාජකාරි ලිපි, විදුලි පුවත් | ● රාජකාරි ලිපියක නිවැරදි ආකෘතිය ඉදිරිපත් කරයි.<br>● රාජකාරි ලිපි, රජය හා සම්බන්ධ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රායෝගික ව හා විධිමත් ව භාවිත කරයි.<br>● විදුලි පුවත් මගින් භාෂාව සකසුරුවම් ව හා අර්ථවත් ව සන්නිවේදනය සඳහා භාවිත කරයි. | 09 |

| | | | | |
|---|---|---|---|---|
| 06.<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී. | 061. නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.<br>062. අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.<br>063. විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.<br>064. පොත පත කියවීමෙන් ග්‍රහණය කරගත් කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කරයි.<br>065. ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අර්ථය වටහාගත් බව ප්‍රකට කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>උම්මග්ග ජාතකයේ මුල සිට පරිබණ්ඩ කතා අවසන දක්වා<br>බුදුගුණ අලංකාරයේ මුල් පද්‍ය 50<br>• **අර්ථාවබෝධය**<br>ගද්‍ය හා පද්‍ය පාඨවල ව්‍යංග්‍යාර්ථ, සමස්තාර්ථ අවබෝධය. | • තෝරා ගත් උචිත පාඨ නිවැරදි උච්චාරණය හා හඬ පාලනය මගින් අන්‍යයන්ට අවබෝධ වන පරිදි කියවීමේ යෙදෙයි.<br>• ඡේදයක් නිශ්ශබ්ද ව කියවා එහි ව්‍යංග්‍යාර්ථය හා සමස්තාර්ථය ප්‍රකාශ කරයි.<br>• අවස්ථාවෝචිත ව විවිධ ශෛලීන්ට අනුව ගද්‍ය හා පද්‍ය පාඨ කියවයි.<br>• බුදුගුණ අලංකාරයේ පද්‍ය විරිත් වලට අනුව ගායනා කරයි.<br>• බුදුගුණ අලංකාරයේ එන ආගමික ඌරුව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 18 |
| 07.<br>ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය කර ගනිමින් ආගමික සමාජයීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම සඳහා වනපොත් කරණයේ යෙදෙ යි. | 07.1. නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරාගත් ගද්‍ය කොටස් හා පද්‍ය වනපොත් කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>බුදුගුණ අලංකාරයේ මුල් පද්‍ය 50<br>මිතුරන්ගේ අගය, උම්මග්ග ජාතකයේ මුල සිට පරිබණ්ඨ කතා අවසාන දක්වා | • වනපොත් කිරීම ආගමික හා සමාජයීය කටයුතුවල දී අර්ථවත් ව හා ඵලදායී ව යොදා ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>• තර්කානුකූල ව කරුණු දැක්වීම සඳහා වනපොත් කරණය විශාල පිටිවහලක් වන බව ප්‍රකාශ කරයි.<br>• ''මිතුරන්ගේ අගය'' කෘතියේ ආදර්ශ චරිතායනය කරයි. | 12 |
| 08.<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 8. 1. ගද්‍ය හා පද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>බුදුගුණ අලංකාරයේ මුල් පද්‍ය 50<br>මිතුරන්ගේ අගය, උම්මග්ග ජාතකයේ මුල සිට පරිබණ්ඨ කතා අවසාන දක්වා | • විවේක කාලය අර්ථවත් ව හා ඵලදායී ව යොදා ගැනීම සඳහා සාහිත්‍ය කෘති පරිශීලනය කරයි.<br>• රසඥතා වර්ධනය සඳහා උසස් නිර්මාණ ඇසුරු කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ විවිධ ශෛලීන්ට අනුව හඬ නගා කියවයි. | 09 |

| | | | | |
|---|---|---|---|---|
| 09.<br>අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | 09.1. පද්‍ය නිර්මාණය කරයි.<br>09.2. නිර්මාණාත්මක කතා රචනා කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • නිර්මාණකරණය යනු අත්දැකීම්වල ප්‍රතිනිර්මාණයක් බව ප්‍රකාශ කරයි.<br>• ගද්‍ය හා පද්‍ය නිර්මාණවලින් සිය දක්ෂතා එළිදක්වයි. | 12 |
| 10.<br>සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ව ඵලදායී ලෙස යොදා ගනියි. | 10.1. විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුද්ද මගින් භාෂා කාර්යයන් ප්‍රායෝගික ව ඉටු කර ගනියි.<br>10.2. දේශන, සාකච්ඡා ආදියට සවන් දීමේ පුරුද්ද මගින් විචාරශීලී ව භාෂාව හසුරුවයි.<br>10.3. විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි.<br>10.4. සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි. | **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • මාධ්‍ය සන්නිවේදනයේ දී භාෂාවේ කාර්යභාරය හා වැදගත්කම ඉස්මතු කොට දක්වයි.<br>• භාෂා ප්‍රගුණතා ව සඳහා විද්‍යුත් මාධ්‍ය සන්නිවේදනයට ප්‍රතිචාර දක්වයි.<br>• ප්‍රවෘත්ති හා ප්‍රකාශවල වැදගත් කරුණු ගෙනහැර දක්වයි.<br>• සාහිත්‍ය නිර්මාණ ඇසුරින් වින්දනය ලබයි. | 14 |
| 11.<br>තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ව ප්‍රදර්ශනය කරයි. | 11 1. සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි<br>.<br>11 2. තර්කානුකූල ව, විචාරශීලී ව හා නිවැරදි ව බස හසුරුවමින් ව්‍යක්ත ව කථනයේ යෙදෙයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • කථිකත්වය ප්‍රකට කරමින් අදහස් ප්‍රකාශ කරයි.<br>• කථන අවස්ථා ඇසුරින් කථන කුසලතා ප්‍රකට කරයි.<br>• කිසියම් මාතෘකාවකට අනුව තර්කානුකූල ව හා විචාරශීලී ව වාද විවාද කරයි. | 20 |
| 12.<br>සාහිත්‍ය රසාස්වාදයට හා විචාරයට අදාළ මූලික ඉගැන්වීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 12 1. රසාස්වාදයට අදාළ සිද්ධාන්ත හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>12 2. තෝරා ගත් ගද්‍ය හා පද්‍ය කොටස් මූලික විචාර ධර්මවලට අනුව විග්‍රහ කරමින් රස විඳියි. | • **රසාස්වාදය පිළිබඳ සාමාන්‍ය අවබෝධය (මූලධර්මවලට අනුව)** | • සාහිත්‍ය රසාස්වාදය හා විචාරය පිළිබඳ ව මූලික සිද්ධාන්ත ඇසුරෙන් නිර්මාණ ඇගයීමට ලක්කරයි.<br>• උසස් නිර්මාණ හඳුනා ගෙන ඒවා ඇසුරු කිරීමට පෙළඹෙයි. | 09 |

| | | | | |
|---|---|---|---|---|
| 13.<br>භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි. | 13 1. සංස්කෘතික හර පද්ධතීන් අගය කරමින් කියවයි.<br>13 2. දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ පරිශීලනය කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්.**<br><br>වන කතා - මිතුරන්ගේ අගය, බුදුගුණ අලංකාරයේ මුල් පද්‍ය 50, උම්මග්ග ජාතකයේ මුල සිට පරිඛණ්ඩ කතා අවසාන දක්වා | • ජීවිතය හැඩගැස්වීමෙහිලා භාෂාව හා සාහිත්‍යය මහෝපකාරී වන බව ප්‍රකාශ කරයි.<br>• සංස්කෘතික හර පද්ධතීන් ඇගයීමට ලක්කරමින් ඒවා චරිතායනය කරයි.<br>• උසස් නිර්මාණ ඇසුරු කිරීමට පෙළඹෙයි.<br>• විවිධ සංස්කෘතික හර පද්ධතීන් පිළිබඳ ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 09 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ :**

- සිංහල 3 - මූලික පිරිවෙණ - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- බුදුගුණ අලංකාරයේ කවි (මුල් පද්‍ය 50)
- උම්මග්ග ජාතකය (මුල සිට පරිඛණ්ඩ කථා අවසනට)
- වනකථා - මිතුරන්ගේ අගය / යක්කඩුවේ ප්‍රඥාරාම හිමි

**විෂය සමගාමී ක්‍රියාකාරකම් :**

සාහිත්‍ය සමිතිය, බිත්ති පුවත්පත් නිර්මාණය, සඟරා නිර්මාණ, සිංහල භාෂා දින සැමරුම්, ප්‍රදර්ශන, පුස්තකාල පරිහරණය

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය
# 4 ශ්‍රේණිය - සිංහල

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01.<br>අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 1. 1. අක්ෂර ව්‍යවහාරය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.<br><br>1. 2. ශ, ෂ, ස භේදය හා ඓ, ඖ අක්ෂර නිවැරදි ව භාවිත කරයි. | • **අක්ෂර මාලාව :**<br>★ අක්ෂර ව්‍යවහාරය :<br>ස්වර, ව්‍යඤ්ජන, ස්වරාරූඪ ව්‍යඤ්ජන, සංයුක්තාක්ෂර, පිලි භාවිතය<br>★ අක්ෂර වින්‍යාසය :<br>ඓ, ඖ, ශ, ෂ, ස භාවිතය | • අක්ෂර මාලාවේ ස්වර ව්‍යඤ්ජන හඳුනා ගෙන අනුපිළිවෙළින් ලියයි.<br>• ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වරාරූඪ කිරීම හා ස්වරාරූඪ ව්‍යඤ්ජන වෙන්කර දක්වීම නිවැරදි ව සිදු කරයි.<br>• ලේඛන කාර්යය සඳහා අක්ෂර හා පිල්ලම් උපයෝගී වන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• භාෂාවේ භාවිත පිල්ලම් හඳුනා ගෙන ලේඛන කාර්යයේ දී නිවැරදි ව භාවිත කරයි.<br>• ඓ, ඖ, ශ, ෂ, ස අක්ෂර ප්‍රායෝගික ලේඛන කාර්යයේ දී නිවැරදි ව යොදා ගනියි.<br>• සංයුක්තාක්ෂර භාවිත කරමින් වචන නිවැරදි ව ලියා දක්වයි. | 12 |
| 02.<br>ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී. | 2 1. සාමාන්‍ය හා විශේෂ රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.<br>2 2. සන්ධි, සමාස, කෘදන්ත, තද්ධිත යන ව්‍යාකරණාංග පද සාධනයට යොදා ගනී.<br>2 3. නේපාතික කෘදන්ත හඳුනා ගෙන ලේඛන කාර්යයේ යෙදෙයි.<br>2 4. වාක්‍ය සැකසීමේ දී ආඛ්‍යාතය නිවැරදි ව භාවිත කරයි. | • නාම පද : ශබ්ද ප්‍රකෘති, නාම විභක්ති ප්‍රත්‍යය<br>• **ආඛ්‍යාත පද** : ධාතු ප්‍රකෘති ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය, ආඛ්‍යාත ප්‍රභේද, විධි, ප්‍රාර්ථනා, ප්‍රයෝජ්‍ය ක්‍රියා පිළිබඳ ව සාමාන්‍ය අවබෝධය<br>• **සන්ධි :** සන්ධි විධි, සන්ධි ප්‍රභේද (සාමාන්‍ය අවබෝධය)<br>• **සමාස :** සමාස ප්‍රභේද පිළිබඳ ව සාමාන්‍ය අවබෝධය<br><br>• **ප්‍රත්‍යයාර්ථ නාම :** තද්ධිත, කෘදන්ත (සාමාන්‍ය අවබෝධය) | • නාම ප්‍රකෘති සහ ධාතු ප්‍රකෘති නිවැරදි ව වෙන් කර දක්වයි.<br>• නාම පද විභක්තිවල වරනගයි.<br>• පද, සන්ධි-විසන්ධි කරමින් නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• සන්ධි කාර්යයන් හඳුනා ගෙන විස්තර කරයි.<br>• සන්ධි ක්‍රම (විධි) නම් කරයි.<br>• සමාස ප්‍රභේද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br><br>• ප්‍රත්‍යයාර්ථ නාම ප්‍රභේද වශයෙන් හඳුනා ගෙන විස්තර කරයි. | 28 |

| | | | | |
|---|---|---|---|---|
| | | • **නෛපාතික කෘදන්ත :** පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා ආවස්ථික ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා) පිළිබඳ ව සාමාන්‍ය අවබෝධය | • සන්ධි, සමාස, ප්‍රත්‍යයාර්ථ නාම පද සාධනයේ දී නිවැරදි ව යොදාගනියි.<br>• ක්‍රියාපද ප්‍රභේද වෙන් වශයෙන් හඳුනා ගෙන විග්‍රහ කරයි.<br>• සාමාන්‍ය වාක්‍ය රීතිය හඳුනා ගෙන ලේඛන කාර්යයේ දී නිවැරදි ව භාවිත කරයි.<br>• විශේෂ වාක්‍ය රීති ප්‍රායෝගික ලේඛන කාර්යය සඳහා නිවැරදි ව භාවිත කරයි. | |
| 03.<br>භාෂා ක්‍රියාකාරකම් මගින් වාග් මාලාව පෝෂණය කරගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි. | 3 1. ප්‍රදේශීය භාෂා විෂමතාවන් හඳුනා ගෙන භාෂා භාවිතයේ යෙදෙයි.<br>3 2. මානව සම්බන්ධතා පැවැත්වීමේ දී ප්‍රදේශීය භාෂා විෂමතාවන් බාධාවක් නොවන බව පෙන්වා දෙයි. | • **ප්‍රදේශීය භාෂා :** ප්‍රදේශීය ව්‍යවහාරයන් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | • ප්‍රදේශීය භාෂාවන්හි විවිධතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• මානව සම්බන්ධතා සඳහා ප්‍රදේශීය ව්‍යවහාර අත්‍යවශ්‍ය ම නොවන බව අවබෝධයෙන් ප්‍රකාශ කරයි. | 12 |
| 04.<br>අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4 1. උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් නිරවුල් ව ඉදිරිපත් කරයි.<br>4 2. ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.<br>4 3. පාඨයක අන්තර්ගතය හකුළුවා ව්‍යක්ත ලෙස ඉදිරිපත් කරයි. | • **වාක්‍ය නිර්මාණය :**<br>★ උක්තාඛ්‍යාත යෝගය පිළිබඳ ව සාමාන්‍ය සහ විශේෂ රීති<br>★ කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය<br>• **රචනය :** මාතෘකාවට අදාළ විවිධ රචනා<br>• **සාරාංශකරණය :** සාරාංශකරණය පිළිබඳ ව විස්තරාත්මක අවබෝධය<br>• **විරාම ලක්ෂණ :**සමාන ලකුණ, ධාතු සූචකය, කුණ්ඩලීය, කාකපාදය<br>• **පද බෙදීම :** පද බෙදීම පිළිබඳ ව මූලික අවබෝධය | • ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය නිර්මාණය කරමින් ලේඛනයේ යෙදෙයි.<br>• කරුණු සංශ්ලේෂණය හා විශ්ලේෂණය කරමින් මාතෘකානුකූල රචනා නිර්මාණාත්මක ව ලියයි.<br>• අත්‍යවශ්‍ය ම කරුණු උකහා දක්වීම සාරාංශකරණය බව කියයි.<br>• අර්ථාවබෝධය සඳහා විරාම ලක්ෂණ හා පද බෙදීම උපකාරී වන බව අවධාරණය කරයි. | 20 |

| | | | | |
|---|---|---|---|---|
| 05.<br>ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 5 1. දෛනික කාර්යයන් හි දී ප්‍රායෝගික ලේඛනයේ යෙදේ. | • **ප්‍රායෝගික ලේඛන :**<br>ආකෘති පත්‍ර, න්‍යාය පත්‍ර, | • ප්‍රායෝගික අවශ්‍යතා සඳහා විවිධ ආකෘති පත්‍ර නිර්මාණය කරයි.<br>• න්‍යායපත්‍රානුකූල ව විවිධ අවස්ථා සංවිධානය කර ක්‍රියාත්මක කරයි. | 10 |
| 06.<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී. | 6 1. අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.<br>6 2. විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.<br>6 3. පොත පත කියවීමෙන් ධාරණය කරගත් කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.<br>6 4. ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අර්ථය වටහා ගත් බව ප්‍රකට කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>සංඝරාජ සාධු චර්යාව<br>ගුත්තිල කාව්‍ය 290-400 කවි<br>• **අර්ථාවබෝධය**<br>සංකීර්ණ ගද්‍ය පද්‍ය පාඨවල අර්ථ අවබෝධය | • නිර්දිෂ්ට ග්‍රන්ථවල අර්ථාවබෝධය ලබමින් නිශ්ශබ්ද ව කියවයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථවල පදගතාර්ථ විග්‍රහ කරයි.<br>• ග්‍රන්ථවලින් ග්‍රහණය කරගත් කරුණු මතකයෙන් ප්‍රකාශ කරයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථ සම්මත ශෛලීන්ට අනුව ශබ්ද නගා කියවයි.<br>• අනිර්දිෂ්ට ග්‍රන්ථයක් පරිශීලනය කරන විට ඊට උචිත ශෛලිය තෝරා ගෙන කියවයි. | 18 |
| 07.<br>ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය ඔස්සේ ආගමික සාමාජීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම පිණිස වනපොත්කරණයේ යෙදෙයි. | 7 1. නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් ගද්‍ය කොටස් හා පද්‍ය වනපොත් කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>ගුත්තිල කාව්‍ය 290-400 කවි<br>සංඝරාජ සාධු චරියාව | • නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරාගත් කොටස් අර්ථාවබෝධය ඇතිව වනපොත් කරයි.<br>• වනපොත් කර ගත් ගද්‍ය පද්‍ය කොටස් සාමාජීය කාර්යයන් සඳහා උචිත ලෙස යොදා ගනියි.<br>• වනපොත් කරගත් කොටස්වල එන සදුපදේශ චරිතායනය කරයි. | 14 |
| 08.<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 8 1. සාහිත්‍ය මූලධර්ම ඇසුරෙන් ගද්‍ය පද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි. | • **සාහිත්‍ය රසාස්වාදය :**<br>ශබ්ද, අර්ථ වාච්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ | • වාච්‍යාර්ථ සහ ව්‍යංග්‍යාර්ථ හඳුනා ගෙන අවබෝධයෙන් විග්‍රහ කරයි.<br>• රස-භාව පිළිබඳ ව මූලික න්‍යායන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.<br>• රසඥතා වර්ධනය සඳහා රසපූර්ණ නිර්මාණ භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි.<br>• රසවත් නිර්මාණවල එන කරුණු ජීවිත පරිඥානය සඳහා භාවිත කරයි. | 12 |

| | | | | |
|---|---|---|---|---|
| 09.<br>අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | 9 1. පද්‍ය නිර්මාණය කරයි.<br>9 2. නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්**<br><br>චරිත තුනක් නවකතාව | • අත්දැකීමක් පාදක කර ගෙන ඒ වස්තු විෂයයට අනුව පද්‍ය කීපයක් නිර්මාණය කරයි.<br>• නිර්මාණාත්මක ලක්ෂණ ප්‍රකට වන සේ ප්‍රබන්ධකරණයේ යෙදෙයි.<br>• නවකතාවක කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 12 |
| 10.<br>සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ව ඵලදායී ලෙස යොදා ගනියි. | 10 1. සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසසඥතා ව වර්ධනය කර ගනියි.<br>10 2. විද්‍යුත් මාධ්‍යවලට සවන් දීමේ පුරුද්ද වර්ධනය කර ගනියි.<br>10 3. විද්‍යුත් මාධ්‍ය නොවන දේශන, සාකච්ඡා ආදියට සවන් දීමේ පුරුද්ද වර්ධනය කර ගනියි.<br>10 4. විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ**<br>චරිත තුනක් නවකතාව<br>ගුත්තිල කාව්‍යයේ 290 - 400 කවි<br>සංසරාජ සාධු චරියාව<br>**විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • ප්‍රශස්ත ගීත, නාට්‍ය, සංවාද ආදියට සවන්දීම රසඥතා වර්ධනයට හේතු වන බව ප්‍රකාශ කරයි.<br>• සාහිත්‍ය විචාර සංවාද මණ්ඩපයක් සූදානම් කොට ක්‍රියාත්මක කරයි.<br>• විද්‍යුත් මාධ්‍යවල ප්‍රවෘත්ති ප්‍රකාශනවලට සවන් දී වැදගත් තොරතුරු සාකච්ඡා කරයි. | 12 |
| 11.<br>අර්ථවත් කථනයෙන් ප්‍රකාශන ශක්තිය වර්ධනය කර ගනියි. | 11 1. කරුණු සංවිධානය කර ගනිමින් නිරවුල් ව හා නිවැරදි ව කතා කරයි.<br>11 2. තර්කානුකූල ව හා විචාරශීලී ව කතා කරයි.<br>113. ආකර්ෂණීය හා නිවැරදි ලෙස නිවේදනයේ හා විස්තර ප්‍රචාරයේ යෙදෙයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • ආකර්ෂණීය ලෙස නිවැරදි උච්චාරණය සහිත ව විස්තර ප්‍රචාරණයේ යෙදෙයි.<br>• තර්කානුකූල ව හා විචාරශීලී ව කරුණු ඉදිරිපත් කරමින් විවාදවල යෙදෙයි.<br>• අංගචලනය, හඬ පාලනය, භාව ප්‍රකාශනය ආදී ශිල්පීය ක්‍රම කථිකත්වය ප්‍රකට කිරීමට භාවිත කරයි. | 18 |

| | | | | |
|---|---|---|---|---|
| 12.<br>සාහිත්‍ය රසාස්වාදයට හා විචාරයට අදාළ මූලික ඉගැන්වීම් පිළිබඳ ව අවබෝධය ලබා භාවිත කරයි. | 12 1. මූලධර්ම පරිශීලනය කරමින් ගද්‍ය පද්‍ය කොටස් විචාරයට ලක්කරයි.<br>12 2. මූලධර්මවලට අනුව විග්‍රහ කරමින් ගද්‍ය පද්‍ය කොටස් රස විඳියි. | • **විචාර මූලධර්ම : විචාර මූලධර්ම පිළිබඳ ව සරල අවබෝධය** | • විචාර මූලධර්ම පිළිබඳ ව අවබෝධය රසඥතාව සඳහා උපකාර වන බව ප්‍රකාශ කරයි.<br>• රස සංකල්පය පිළිබඳ සරල ව අදහස් දක්වයි.<br>• විචාර මූලධර්මයන්ට අනුව ගද්‍ය පද්‍ය කොටස් රසවිඳිමින් විචාරය කරයි. | 10 |
| 13.<br>භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි. | 13 1. සංස්කෘතික උරුමයන් හා හර පද්ධතීන් පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.<br>13 2. දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.<br>13 3. විවිධ ජන කොට්ඨාසවලට අයත් සිරිත් විරිත් හඳුනා ගෙන අවබෝධයෙන් යුතුව කටයුතු කරයි.<br>13 4. ජාතික සමගිය, සහජීවනය හා සාමය උදෙසා එකමුතුව කටයුතු කිරීමේ පුරුදු ඇති කර ගනියි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්.**<br>චරිත තුනක් නවකතාව<br>ගුත්තිල කාව්‍යයේ 290 - 400 කවි<br>සංඝරාජ සාධු චරියාව | • සංස්කෘතික උරුමයන් හා අනන්‍යතා හඳුනා ගෙන ඊට අදාළ සාහිත්‍ය කියවයි.<br>• ජාතිකාභිමානී සහ දේශානුරාගී නිර්මාණ සංග්‍රහයක් ඉදිරිපත් කරයි.<br>• විවිධ ජන කොටස්වල සිරිත් විරිත් හඳුනා ගෙන විස්තර කරයි.<br>• ජාතික සමගිය, සහජීවනය හා සංහිඳියාව සඳහා යහපුරුදු වර්ධනය කරයි.<br>• විවිධ සංස්කෘතික උත්සව අවස්ථා සඳහා ප්‍රායෝගික ව සම්බන්ධ වේ.<br>• චරිත තුනක් කතුවරයාගේ වෙනත් නිර්මාණ කියවා ඔහුගේ ජීවන දර්ශනය විස්තර කරයි. | 12 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ :**

- සිංහල 4 - මූලික පිරිවෙණ - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ගුත්තිල කාව්‍යය - ගුත්තිල මූසිල වීණා වාදයේ සිට දෙව්ලොව වැනුම දක්වා (290 - 400 දක්වා කවි)
- චරිත තුනක් - කේ. ජයතිලක
- සංඝරාජ සාධු චරියාව

**විෂය සමගාමී ක්‍රියාකාරකම් :**
සාහිත්‍ය සමිතිය, බිත්ති පුවත්පත් නිර්මාණය, සඟරා නිර්මාණ, සිංහල භාෂා දින සැමරුම්, ප්‍රදර්ශන, පුස්තකාල පරිහරණය

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය
# 5 ශ්‍රේණිය - සිංහල

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01.<br>අක්ෂරමාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 1 1. අක්‍ෂර මාලාව සවිස්තරාත්මක ව හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.<br><br>1 2. අක්‍ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කරයි. | • **අක්ෂර මාලාව :**<br>ශුද්ධ සිංහල අක්ෂර මාලාව<br>මිශ්‍ර සිංහල අක්ෂර මාලාව<br>නූතන සිංහල අක්ෂර මාලාව<br>⋆ අක්ෂර ව්‍යවහාරය :<br>අක්ෂර ප්‍රභේද, උත්පත්තිස්ථාන, අකාරාදී පිළිවෙළ පිළිබඳ ව සවිස්තර අවබෝධය<br>⋆ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව ප්‍රාමාණිකාත්මක අවබෝධය<br>සාම්ප්‍රදායික රීති<br>ව්‍යවහාර රීති | • ශුද්ධ, මිශ්‍ර, නූතන අක්ෂරමාලාවන්හි වෙනස්කම් නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• සිංහල අක්‍ෂර ප්‍රභේද හඳුනා ගෙන වගුගත කරයි.<br>• අක්‍ෂර වින්‍යාස රීති පිළිබඳව හඳුනා ගෙන නිවැරදිව ලේඛන කාර්යයට යොමු වෙයි.<br>• සාම්ප්‍රදායික භාෂාගත රීති හඳුනා ගෙන කථා කරයි.<br>• නූතන ව්‍යවහාර රීති නිවැරදිව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 14 |
| 02.<br>ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී. | 2 1. සාමාන්‍ය, විශේෂ හා සංකීර්ණ වාක්‍ය රීතිවලට අනුකූල ව වාක්‍ය නිර්මාණය කරයි.<br><br>2 2. පද සාධනය පිළිබඳව අවබෝධයෙන් යුතුව ලේඛන කාර්යයේ යෙදෙයි. | • **පද විභාගය :** නාම, ක්‍රියා, නිපාත, උපසර්ග, විභක්ති පිළිබඳ ව සවිස්තරාත්මක අවබෝධය.<br>• **කාරක :** කාරක පිළිබඳ ව සවිස්තරාත්මක අවබෝධය<br>• **සන්ධි පද :** සන්ධි කාර්ය, සන්ධි විධි, සන්ධි ප්‍රභේද පිළිබඳ ව පූර්ණ අවබෝධය<br>• **සමාස :** සමාස ප්‍රභේද පිළිබඳ ව පූර්ණ අවබෝධය<br>• **ප්‍රත්‍යයාර්ථ නාම :** තද්ධිත, කෘදන්ත පිළිබඳ ව සවිස්තරාත්මක අවබෝධය | • ව්‍යාකරණ විධි පිළිබඳ ව මනා අවබෝධයකින් ඒවා වගුගත කරයි.<br>• පද සාධනය හඳුනා ගෙන නිවැරදි ලෙස ලේඛන කාර්යයේ දී යොදා ගනියි.<br>• සන්ධි කාර්යයන් හා සන්ධි පද පිළිබඳ ව මනා අවබෝධයකින් ලේඛන කාර්යයේ දී යොදා ගනියි.<br>• සමාස ප්‍රභේද පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි. | 28 |

| | | | | |
|---|---|---|---|---|
| | 2 3. නාම, ක්‍රියා, නිපාත, උපසර්ග, සන්ධි, තද්ධිත, කෘදන්ත, විභක්ති පිළිබඳ ව සවිස්තරාත්මක අවබෝධය ලබමින් ලේඛනයේ යෙදෙයි. | • **ආඛ්‍යාත පද :** විධි, ප්‍රාර්ථනා, ප්‍රයෝජ්‍ය ක්‍රියා පිළිබඳ ව සවිස්තරාත්මක අවබෝධය<br>• **නෛපාතික කෘදන්ත :** පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා ආවස්ථික ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා) පිළිබඳ ව සවිස්තරාත්මක අවබෝධය | • ප්‍රත්‍යයාර්ථ නාම හඳුනා ගෙන ප්‍රායෝගික ලේඛනයේ දී භාවිත කරයි.<br>• නෛපාතික කෘදන්ත පද අවබෝධයෙන් භාවිත කරයි. | |
| 03.<br>භාෂා ක්‍රියාකාරකම් මගින් වාග් මාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි. | 3 1. සාම්ප්‍රදායික යෙදුම් භාෂා කාර්යයන් සඳහා යොදයි.<br>3 2. සාම්ප්‍රදායික යෙදුම් හා බැඳි ජනශ්‍රැතිය අධ්‍යයනය කර අර්ථවත් ව භාවිත කරයි.<br>3 3. සාම්ප්‍රදායික යෙදුම් හා පද යොදා ගනිමින් සන්නිවේදනය පහසු කර ගනී.<br>3 4. විවිධ භාෂාවලින් සිංහල වාග් කෝෂය පෝෂණය වී ඇති බව හඳුනා ගෙන භාවිත කරයි. | • **සාම්ප්‍රදායික යෙදුම් :** ඉඟි වැකි, ප්‍රස්තාවපිරුළු, ආප්තෝපදේශ පිළිබඳ ව සවිස්තරාත්මක අවබෝධය<br>• **වාග් කෝෂය පෝෂණය වීම**<br>• තත්භව,තත්සම, නිෂ්පන්න පද භාවිතය පිළිබඳ ව අවබෝධය | • සාම්ප්‍රදායික යෙදුම් භාවිතයෙන් බස රසවත් ව ඉදිරිපත් කළ හැකි අයුරු විස්තර කරයි.<br>• සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• විවිධ භාෂාවන්ගෙන් සිංහල වාග් කෝෂය පෝෂණය වූ බව පිළිගනියි.<br>• හඳුනාගත් වචනවල අර්ථය නිවැරදි ව ලියයි.<br>• ප්‍රස්තාව පිරුළු අර්ථාන්විත ව භාෂා කාර්යයට යොදා ගනී.<br>• ඉඟි වැකි, ආප්තෝපදේශ අතර වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 09 |
| 04.<br>අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4 1. උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් නිරවුල් ව ඉදිරිපත් කරයි.<br>4 2. ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.<br>4 3. පාඨයක අන්තර්ගතය හකුළුවා ව්‍යක්ත ලෙස ඉදිරිපත් කරයි. | • **වාක්‍ය නිර්මාණය :**<br>⋆ උක්තාඛ්‍යාත යෝගය පිළිබඳ ව රීති, කර්තෘකාරක, කර්මකාරක, භාව කාරක<br>• **රචනය :** රචනා සිද්ධාන්ත ඇසුරෙන් විවිධාකාර රචනා<br>• **සාරාංශකරණය :** සංකීර්ණ ගද්‍ය සාරාංශකරණය<br>• **විරාම ලක්ෂණ :** විරාම ලක්‍ෂණ පිළිබඳ ව පූර්ණ අවබෝධය | • උක්ත ආඛ්‍යාත යෝග පිළිබඳ ව අවබෝධයෙන් නිවැරදි ව වාක්‍ය ලියයි.<br>• කාරක පිළිබඳ ව මනා අවබෝධයකින් වාක්‍යකරණයේ නියැලෙයි.<br>• ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් විවිධ මාතෘකා ඔස්සේ රචනා ලියයි.<br>• රචනාකරණයේ භාවිත සිද්ධාන්ත මනා ලෙස යොදා ගනිමින් රචනා ලියයි. | 20 |

| | | | | |
|---|---|---|---|---|
| | | | • සාරාංශ කරණයේදී ශිල්පීය ප්‍රයෝග නිවැරදි ලෙස භාවිත කරයි.<br>• සමස්ත අදහස කුළුගැන්වෙන පරිදි සංකීර්ණ ගද්‍ය කොටස් සාරාංශ කරයි.<br>• ලේඛනයේ දී විරාම ලක්‍ෂණ නිවැරදි ලෙස භාවිත කරයි. | |
| 05.<br>ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 5 1. නිවැරදි ව හා නිර්මාණාත්මක ව ලේඛන සකසයි. | • **ප්‍රායෝගික ලේඛන :**<br>කතුවැකි, අත් පත්‍රිකා, පෝස්ටර්, වෙළෙඳ දැන්වීම්, තීරු ලිපි | • පාඨක රුචිය ඇති වන පරිදි නිර්මාණාත්මක ව කතුවැකි නිර්මාණය කරයි.<br>• පාරිභෝගිකයා, පාඨකයා ආකර්ෂණය කර ගත හැකි පරිදි වෙළෙඳ දැන්වීම් නිර්මාණය කරයි.<br>• අත් පත්‍රිකා, පෝස්ටර් නිර්මාණාත්මක ලෙස සකසයි.<br>• තීරු ලිපියක ශිල්පීය ක්‍රම හඳුනා ගෙන සෙසු අය ආකර්ෂණය කරගත හැකි පරිදි ලියයි. | 09 |
| 06.<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී. | 6 1. අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.<br><br>6 2. පොත පත කියවීමෙන් ධාරණය කරගත් කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.<br><br>6 3. ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අර්ථය වටහාගත් බව ප්‍රකට කරයි. | • **අර්ථාවබෝධය :**<br>සංකීර්ණ ගද්‍ය පද්‍ය කොටස්වල අර්ථාවබෝධය<br><br>• **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>චිරන්තන ගද්‍ය සංග්‍රහය<br>සැළලිහිණි සංදේශය<br>බැද්දේගම නවකතාව | • සැළලිහිණි සංදේශයේ වැනුම්වලින් ගත් පද්‍යවල අර්ථාවබෝධය වටහා ගෙන කියවයි.<br>• චිරන්තන ගද්‍ය සංග්‍රහයේ කතා ඊට ආවේනික ශෛලීන් වලට අනුව කියවයි<br>• බැද්දේගම නව කතාව ඇසුරෙන් කතුවරයාගේ චරිත නිරූපණ සක්‍යතාව පැහැදිලි කරයි<br>• අවස්ථා, සිද්ධි, චරිත පිළිබඳ සැලකිලිමත් වෙමින් බැද්දේගම නව කථාව කියවයි.<br>• සැළලිහිණි සංදේශයේ තෝරාගත් පද්‍ය වන පොත් කරයි. | 12 |

| | | | | |
|---|---|---|---|---|
| 07.<br>ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය ඔස්සේ ආගමික සමාජීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම සඳහා වනපොත්කරණයේ යෙදෙයි. | 7 1.<br>නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරාගත් ගද්‍ය කොටස් හා පද්‍ය වනපොත් කරයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>චිරන්තන ගද්‍ය සංග්‍රහය<br>සැළලිහිණි සංදේශය<br>බැද්දේගම නවකතාව | • සැළලිහිණි සංදේශයෙන් තෝරාගත් පද්‍ය වනපොත් කර එහි අර්ථ විස්තර කරයි<br>• චිරන්තන ගද්‍ය සංග්‍රහයේ කතා වලින් උකහා ගත් කරුණු සමාජ සත්කාර්යයන් සඳහා උචිත ලෙස යොදා ගනියි.<br>• බැද්දේගම නව කතාව කියවීමෙන් ලත් දැනුම සමාජ ජීවිතය සාර්ථක කර ගැනීමට භාවිත කරයි. | 20 |
| 08.<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 8 1.<br>සාහිත්‍ය විචාර මූලධර්ම ඇසුරෙන් ගද්‍ය හා පද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි. | • **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>චිරන්තන ගද්‍ය සංග්‍රහය<br>සැළලිහිණි සංදේශය<br>නූතන පද්‍ය කාව්‍ය සංහිතා | • සැළලිහිණි සංදේශයේ පද්‍ය රසවිඳිමින් කියව යි.<br>• චිරන්තන ගද්‍ය සංග්‍රහයේ කතා කියවා එහි ආදර්ශයන් චරිතායනය කරයි<br>• නූතන පද්‍ය කාව්‍ය සංහිතාහි ඇතුළත් පද්‍ය ඒ ඒ සාහිත්‍ය යුග අනුව බෙදා දක්වයි<br>• රසඥතා වර්ධනය කර ගැනීම සඳහා නූතන පද්‍ය කාව්‍ය සංහිතාහි පද්‍ය කියවයි | 16 |
| 09.<br>අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | 9 1. පද්‍ය නිර්මාණය කරයි.<br>9 2. නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.<br>9 3. කෙටි නාට්‍ය පිටපත් සකස් කරයි.<br>9 4. ගද්‍ය පද්‍ය ලිපි සංග්‍රහයක් සකස් කරයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • අත්දැකීම් පාදක කොට ගෙන පද්‍යකරණයේ යෙදෙයි.<br>• අත්දැකීම් ඇසුරෙන් නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ නියැලෙයි.<br>• ස්වනිර්මාණ සංග්‍රහයන් එළි දක්වයි.<br>• සාහිත්‍ය සමිතියේ රඟ දැක්වීමට කෙටි නාට්‍ය පිටපතක් රචනා කරයි. | 12 |

| | | | | |
|---|---|---|---|---|
| 10.<br>සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතාව ඵලදායී ලෙස යොදා ගනියි. | 10 1.<br>විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු භාෂා කාර්යයන් ප්‍රායෝගික ව ඉටුකර ගැනීම සඳහා යොදා ගනී.<br>10 2.<br>දේශන සාකච්ඡා ආදියට සවන් දීමේ පුරුද්ද මගින් විචාරශීලී ව භාෂාව හැසිරවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.<br>10 3.<br>සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • ප්‍රායෝගික භාෂා කාර්යය ඉටුකර ගැනීම සඳහා විද්‍යුත් මාධ්‍ය භාවිතයේ අගය වටහා ගෙන ඒ සඳහා යොදා ගනියි.<br>• දේශන, සාකච්ඡා ආදියට සවන්දීම තුළින් විචාරශීලී ව කටයුතු කිරීමේ හැකියා ව වර්ධනය කර ගනියි.<br>• විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් ලත් දැනුම අර්ථවත් ව භාවිත කරයි.<br>• විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් රැස්කර ගත් තොරතුරු ඉදිරිපත් කරයි. | 12 |
| 11.<br>තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ව ප්‍රදර්ශනය කරයි. | 11 1. කරුණු සංවිධානය කර ගනිමින් නිරවුල් ව හා නිවැරදි ව කථනයේ යෙදෙයි.<br>11 2. තර්කානුකූල ව හා විචාරශීලී ව කථනයේ යෙදෙයි.<br>11 3. නිවැරදි ව බස හසුරුවමින් ආකර්ෂණීය ලෙස නිවේදනයේ හා විස්තර ප්‍රචාරයේ යෙදෙයි. | • **විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්** | • තම අදහස් තර්කානුකූල ව ඉදිරිපත් කරයි.<br>• කරුණු සංවිධානය කර ගනිමින් විචාරශීලී ව කථන කුසලතා ව සංවර්ධනය කර ගනියි.<br>• මාතෘකාවන්ට අනුකූල ව ආකර්ෂණීය හා නිවැරදි ලෙස කථනයේ යෙදෙයි.<br>• කථන කුසලතා ව දියුණු කර ගෙන සන්නිවේදන කාර්යයේ දී භාෂාව ව්‍යක්ත ලෙස යොදා ගනියි. | 09 |
| 12.<br>සාහිත්‍ය රසාස්වාදයට හා විචාරයට අදාළ මූලධර්ම පිළිබඳ ව අවබෝධයෙන් යුතුව රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | 12 1. මූලධර්ම පරිශීලනය කරමින් ගද්‍ය පද්‍ය කොටස් විචාරයට ලක්කරයි.<br>12 2. මූලධර්මවලට අනුව විග්‍රහ කරමින් ගද්‍ය පද්‍ය කොටස් රස විඳියි. | • **රසාස්වාදය :** රසාස්වාදය පිළිබඳ ව පූර්ණ අවබෝධය.<br>• **විචාර මූලධර්ම** : රස, භාව, අලංකාර පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධය | • විචාර මූලධර්ම භාවිත කර ගනිමින් නිර්දිෂ්ට ග්‍රන්ථ රස විඳියි.<br>• සාහිත්‍ය විචාරයේ හා රසාස්වාදයේ දී මූලධර්ම සිද්ධාන්ත යොදා ගනියි.<br>• සාහිත්‍ය විචාර මූලධර්මයන්ට අනුව ඒ ඒ නිර්මාණයන්ට අදාළ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි. | 18 |

| | | | | |
|---|---|---|---|---|
| 13.<br>භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි. | 13 1.<br>සංස්කෘතික උරුමයන් හා සමාජ හර පද්ධතීන් පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.<br><br>13 2.<br>දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.<br><br>13 3.<br>විවිධ ජන කොට්ඨාසවලට අයත් සිරිත් විරිත් හඳුනා ගෙන අවබෝධයෙන් සහ සහජීවනයෙන් යුතු ව කටයුතු කරයි. | • **සාහිත්‍ය ඉතිහාසය**<br>• **නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්**<br>චිරන්තන ගද්‍ය සංග්‍රහය<br>බැද්දේගම නවකතාව<br>නූතන පද්‍ය කාව්‍ය සංහිතා | • විවිධ සංස්කෘතික උත්සවයන්හි අනන්‍යතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• විවිධ ජන කොටස්වලට අයත් සංස්කෘතීන් අගය කරයි.<br>• තම සංස්කෘතිය පිළිබඳ ව අභිමානයෙන් කථා කරයි.<br>• නූතන පද්‍ය කාව්‍ය සංහිතා හි දේශාභිමානී හා දේශානුරාගී නිර්මාණ ඇසුරු කිරීමට ප්‍රියතාවක් දක්වයි.<br>• බැද්දේගම නව කතාවෙන් හෙළිවන විවිධ සංස්කෘතිකාංග අගය කරයි<br>• චිරන්තන ගද්‍ය සංග්‍රහයේ එන කතාවන්ට අදාළ යුගවල විවිධ භාෂා ප්‍රවණතා පිළිබඳ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නූතන කවීන්ගේ නිර්මාණ වලට පාදක වූ අනුභූතීන් හි විවිධතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 13 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ :**

- සිංහල 5 - මූලික පිරිවෙණ - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- නූතන පද්‍ය කාව්‍ය සංහිතා - සංස්කරණය, මහාචාර්ය සුනිල් ආරියරත්න
- සැළලිහිණි සංදේශය
- බැද්දේගම - අනුවාදක ඒ. පී. ගුණරත්න
- චිරන්තන ගද්‍ය සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (2016 මුද්‍රණය)

**ආශ්‍රේය ග්‍රන්ථ :**

- සිදත් සඟරාව
- සාහිත්‍ය කතා - හේන්පිටගෙදර ඥාණසීහ හිමි
- සිංහල සාහිත්‍යය 1 - 2 - හොරණ වජිරඥාණ හිමි
- සිංහල භාෂාව, රචනය හා රසාස්වාදය - පී. තේනබදු
- ව්‍යාකරණ විවරණ - කුමාරතුංග මුනිදාස
- 1, 2, 3, 4 සිංහල සාහිත්‍ය - ආනන්ද කුලසූරිය

**විෂය සමගාමී ක්‍රියාකාරකම් :**

සාහිත්‍ය සමිතිය, බිත්ති පුවත්පත් නිර්මාණය, සඟරා නිර්මාණ, සිංහල භාෂා දින සැමරුම්, ප්‍රදර්ශන, පුස්තකාල පරිහරණය